සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**Provincial Department of Education - NWP**

| 02 | S | I |
|---|---|---|

තුන්වන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2019

## Third Term Test - Grade 13 - 2019

විභාග අංකය .............................

# රසායන විද්‍යාව I

කාලය පැය දෙකයි

**සැලකිය යුතුයි**

- මෙම ප්‍රශ්න පත්‍රය සමග ආවර්තිතා වගුවක් සපයා ඇත.
- ගණක යන්ත්‍ර භාවිතයට ඉඩ දෙනු නොලැබේ.
- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ විභාග අංකය ලියන්න.
- 1 සිට 50 තෙක් වූ එක් එක් ප්‍රශ්නයට යන (1), (2), (3), (4), (5) පිළිතුරුවලින් නිවැරදි හෝ ඉතාමත් ගැලපෙන හෝ පිළිතුර තෝරාගෙන , එය උත්තර පත්‍රයේ පිටුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක් යොදා දක්වන්න.

සාර්වත්‍ර වායු නියතය R = 8.314 J $mol^{-1}K^{-1}$ / ඇවගාඩ්රෝ නියතය $N_A = 6.022 \times 10^{23}\ mol^{-1}$ /ප්ලාන්ක් නියතය $h = 6.626 \times 10^{-34}\ J\,S$ / ආලෝකයේ ප්‍රවේගය $C = 3 \times 10^{8}\ ms^{-1}$

---

1. වියුග්ම ඉලෙක්ට්‍රෝන තුනක් ඇති ප්‍රභේදය වන්නේ,
   1. $Fe^{3+}$ 2. $V^{3+}$ 3. $Cr^{3+}$ 4. $S^{2-}$ 5. $Cu^{2+}$

2. $OCN^-$ හි ස්ථායි ලුවිස් ව්‍යුහය සම්බන්ධයෙන් **<u>අසත්‍ය</u>** වන්නේ,
   1. අණුව තුල එකසර ඉලෙක්ට්‍රෝන යුගල් 4ක් පවතී. 2. $N$ පරමාණුව මත -2 ක ආරෝපණයක් ඇත.
   3. මෙම අණුව තුල සිග්මා බන්ධන දෙකක් ඇත. 4. කාබන් පරමාණුව $sp$ මුහුම්කරණය දක්වයි.
   5. මෙම අණුව රේඛීය වේ.

3. ඒකසර ඉලෙක්ට්‍රෝන වැඩිතම අණුව වන්නේ,
   1. $O_3$ 2. $SCN^-$ 3. $CO_2$ 4. $ClO_2^-$ 5. $NO_2^-$

4. 
```
             CHO                  O
              |                   ||
CH3CH2 –  C –  CH = CH – C – NH2
              |
             CH3
```
යන සංයෝගයේ IUPAC නාමය වනුයේ,
   1. 4-ethyl-4-methyl – 5 – oxo – 2 – hexenamide 2. 4-formyl – 4 – methyl – 2 – hexenamide
   3. 4-ethyl-4-formyl-2-pentenamide 4. 4-formyl-4-methyl-2-hexene amide
   5. 4-ethyl-4-methyl-5-oxo-2-hexene amide

5. අම්ල වැසි සඳහා හේතු වන වායුමය දූෂකයක් **<u>නොවන්නේ,</u>**
   1. $CO_2$ 2. $SO_2$ 3. $SO_3$ 4. $NO_2$ 5. $NO$

6.  යන සංයෝගය භාස්මික තත්ත්ව යටතේ ( NaOH(aq) හමුවේ) ස්වයං සංඝනනයෙන් ලැබෙන ඵලය වන්නේ,

1. 
2. 
3. 
4. 
5. 

7. $2A(s) + B_2(g) \rightarrow 2AB(g)$ ; $\Delta H^{\theta} = +\ x\ kJ\ mol^{-1}$
යන ප්‍රතික්‍රියාව සම්බන්ධයෙන් පහත කුමන ප්‍රකාශය **සත්‍ය** වේද?
1. ප්‍රතික්‍රියාව සෑම උෂ්ණත්වයකදී ම ස්වයංසිද්ධ වේ.
2. ප්‍රතික්‍රියාවේ $\Delta S^{\theta}$ ඍණ අගයක් වන අතර පහළ උෂ්ණත්වවල දී ප්‍රතික්‍රියාව ස්වයංසිද්ධ වේ.
3. ප්‍රතික්‍රියාවේ $\Delta S^{\theta}$ ධන අගයක් වන අතර සියලු උෂ්ණත්වවල දී ප්‍රතික්‍රියාව ස්වයංසිද්ධ නොවේ.
4. ප්‍රතික්‍රියාවේ $\Delta S^{\theta}$ ධන අගයක් වන අතර ඉහළ උෂ්ණත්වවල දී ප්‍රතික්‍රියාව ස්වයංසිද්ධ වේ.
5. ප්‍රතික්‍රියාවේ $\Delta S^{\theta}$ ඍණ අගයක් වන අතර ඉහළ උෂ්ණත්වවල දී ප්‍රතික්‍රියාව ස්වයංසිද්ධ වේ.

8. විඝටන නියතය $1 \times 10^{-8}\ mol\ dm^{-3}$ වන HIn නම් දර්ශකය ජලීය ද්‍රාවණයක දී පහත ආකාරයේ සමතුලිතතාවයක පවතී.

$$\underset{\text{අවර්ණ}}{HIn\ (aq)} + H_2O\ (l) \rightleftharpoons H_3O^+(aq) + \underset{\text{රතු}}{In^-(aq)}$$

ඉහත දර්ශකය සම්බන්ධයෙන් **අසත්‍ය** වන්නේ,
1. pH අගය 6.0 වන ද්‍රාවණයක දී මෙම දර්ශකය අවර්ණවේ.
2. pH අගය 12 වන ද්‍රාවණයක දී මෙම දර්ශකය රතු වර්ණය පෙන්වයි.
3. $0.1\ moldm^{-3}$ ප්‍රබල අම්ලයක් හා $0.1\ mol\ dm^{-3}$ ප්‍රහල භස්මයක් අතර සිදුවන අනුමාපනයක් සඳහා මෙම දර්ශකය යොදා ගත හැක.
4. $1 \times 10^{-3}\ mol\ dm^{-3}\ HNO_3$ හා $1 \times 10^{-3}\ mol\ dm^{-3}\ NaOH$ අතර අනුමාපනය සඳහා මෙම දර්ශකය යොදා ගත හැක.
5. ප්‍රබල භස්මයක් හා දුබල අම්ලයක් අතර සිදුවන අනුමාපනයක් සඳහා මෙම දර්ශකය යොදා ගත හැක.

9. $Na_2SO_3$ සහ $Na_2S_2O_3$ ජලීය ද්‍රාවණ 2ක් එකිනෙකින් වෙන්කර හඳුනා ගැනීම සඳහා පහත දී ඇති ද්‍රාවණ අතුරෙන් කුමක් භාවිතා කළ **නොහැකිද**?
1. $AgNO_3$ 2. $Pb(NO_3)_2$ 3. HCl 4. $H_2SO_4$ 5. $Na_2CO_3$

10. $KCl$ සහ $KClO_3$ අඩංගු ඝන සංයෝගයකින් $3.20\ g$ තාපය හමුවේ වියෝජනය කළ විට $2.42g$ ක නියත ස්කන්ධයක් සහිත ඝන ශේෂයක් ඉතිරි විය. මුල් සාම්පලයේ තිබූ $KCl$ ස්කන්ධය ගණනය කරන්න.
$(K = 39, Cl = 35.5, O = 16)$
1. 0.78 g 2. 1.21 g 3. 2.21g 4. 0.42 g 5. 1.00 $g$

11. ද්‍රවිත ජලයේ ගුණාත්මකභාවය පරීක්ෂා කිරීම සඳහා යොදා ගන්නා භෞතික පරාමිතියක් **නොවන්නේ**,
1. pH අගය 2. උෂ්ණත්වය 3. සන්නායකතාව
4. පීඩනය 5. කඨිනත්වය

12. $TiO_2$ නිෂ්පාදනය සම්බන්ධයෙන් සත්‍ය වන්නේ,
1. ගල් අඟුරු හා ක්ලෝරීන් වායුව හමුවේ Ti $900\ ^0C$ ට පමණ රත් කරයි.
2. අපද්‍රව්‍ය ඉවත් කරන ලද Ti ද්‍රව - ඔක්සිජන් වායුව හමුවේ $1200\ ^0C$ ට පමණ රත් කරනු ලැබේ.
3. ගල් අඟුරු හා ක්ලෝරීන් වායුව හමුවේ $900\ ^0C$ ට පමණ රූටයිල් රත් කරනු ලබයි.
4. අපද්‍රව්‍ය ඉවත් කළ $TiCl_4$ (l) වාතය හමුවේ $900\ ^0C$ ට පමණ රත්කර $TiO_2$ ලබාගනී.
5. $TiO_2$ නිෂ්පාදනය සඳහා අමුද්‍රව්‍යයක් ලෙස ලබා ගන්නා රූටයිල් සුදු පැහැති වේ.

13. සංයෝගවල භස්ම ප්‍රබලතාවය විචලනය වන අයුරු නිවැරදිව දක්වා ඇත්තේ පහත කුමකද?
1. $C_6H_5NH_2 < C_2H_5OH$ 2. $C_6H_5NH_2 < CH_3CONH_2$ 3. $CH_3CH_2NH_2 < C_2H_5OH$
4. $CH_3NH_2 < NH_3$ 5. $CH_3CONH_2 < CH_3NH_2$

14. 298 K දී $CuS(s)$ හි ජල ද්‍රාව්‍යතාවය $2 \times 10^{-18}\ mol\ dm^{-3}$ වේ. $0.010\ mol\ dm^{-3}\ Na_2S$ ජලීය ද්‍රාවණයක් තුළ දී $CuS$ හි ද්‍රාව්‍යතාවය කොපමණද?
1. $2 \times 10^{-16} mol\ dm^{-3}$ 2. $2 \times 10^{-34}\ mol\ dm^{-3}$ 3. $4 \times 10^{-34}\ mol\ dm^{-3}$
4. $2 \times 10^{-36} mol\ dm^{-3}$ 5. $4 \times 10^{-36} mol\ dm^{-3}$

15. $H^+ / MnO_4^- \rightarrow Mn^{2+}$ බවට ඔක්සිහරණය කළ **නොහැක්කේ** පහත කුමකින්ද?
1. $Fe^{2+}$ 2. $SO_4^{2-}$ 3. $C_2O_4^{2-}$ 4. $H_2S$ 5. $H_2O_2$

16. ජලයේ යාන්තමින් ද්‍රාව්‍ය $A_2B_3(s)$ ලවණයක් මෙසේ විඝටනය වේ.
$A_2B_3(s) \rightleftharpoons 2A^{3+}(aq) + 3B^{2-}(aq)$

$TK$ උෂ්ණත්වයක දී $A_2B_3$ ලවණයේ ද්‍රව්‍යතා ගුණිතය $X\ mol^5 dm^{-15}$ නම් $TK$ හිදී සමතුලිතතාවයෙ පවතින $B^{2-}(aq)$ සාන්ද්‍රණය වනුයේ, (mol $dm^{-3}$ වලින්)

1. $(\frac{x}{108})^{\frac{1}{5}}$ 2. $(\frac{3x}{108})^{\frac{1}{5}}$ 3. $(\frac{4x}{108})^{\frac{1}{5}}$ 4. $3(\frac{x}{108})^{\frac{1}{5}}$ 5. $3x^{\frac{1}{2}}$

17. 298 $K$ දී පහත තාප රසායනික දත්ත සළකන්න.

| | |
|---|---|
| ඇලුමිනියම් හි සම්මත පරමාණුකරන එන්තැල්පිය | 326.4 kJ $mol^{-1}$ |
| ක්ලෝරීන්හි සම්මත පරමාණුකරන එන්තැල්පිය | 122.0 kJ $mol^{-1}$ |
| $AlCl_3(s)$ හි සම්මත උත්පාදන එන්තැල්පිය | $-704.0$ kJ $mol^{-1}$ |
| $AlCl_3(s)$ හි සම්මත ඌර්ධවපාතන එන්තැල්පිය | x kJ $mol^{-1}$ |

$Al - Cl(g)$ බන්ධනයේ සම්මත බන්ධන විඝටන එන්තැල්පිය kJ $mol^{-1}$ වලින් වනුයේ,

1. $\frac{(1213.4-x)}{3}$ 2. $\frac{x-1213.4}{3}$ 3. $x - 1213.4$ 4. $\frac{1396.4-x}{3}$ 5. $\frac{213.4-x}{3}$

18. $E^{\emptyset}$ [$Ni^{2+}$(aq) Ni(s)] = $-0.25$ V
$E^{\emptyset}$ [$Cl_2$(g) $Cl^-$(aq)] = $+1.36$ V ලෙස දී ඇත.
ඉහත ඉලෙක්ට්‍රෝඩ යුගල භාවිතා කරමින් සාදා ගන්නා ලද කෝෂයේ IUPAC නිරූපණය සහ කෝෂයේ විද්‍යුත් ගාමක බලය පිළිවෙලින් වනුයේ,

| කෝෂයේ නිරූපණය | විද්‍යුත් ගාමක බලය |
|---|---|
| 1. Pt(s) \| $Cl^-$(aq, 1 $moldm^{-3}$ )\| $Cl_2$(g, 1atm)\|\| $Ni^{2+}$(aq, 1.0 $moldm^{-3}$)\| Ni(s) | 1.11V |
| 2. Ni(s) \| $Ni^{2+}$(aq , 1.0 $moldm^{-3}$) \|\| Pt(s)$Cl_2$(g, 1atm)/ $Cl^-$(aq, 1.0 $moldm^{-3}$ | 1.61 V |
| 3. Ni(s) \| $Ni^{2+}$(aq , 1.0 $moldm^{-3}$)\|\| $Cl^-$(aq, 1.0 $moldm^{-3}$) \| $Cl_2$(g, 1atm)\| Pt(s) | 1.61V |
| 4. Pt(s)\| $Cl_2$(g, 1atm)\| $Cl^-$(aq, 1.0 $moldm^{-3}$ \|\| $Ni^{2+}$aq , 1.0 $moldm^{-3}$ \| Ni(s) | 1.11V |
| 5. Ni(s) \| $Ni^{2+}$(aq , 1.0 $moldm^{-3}$)\|\|$Cl_2$(g, 1atm)\| $Cl^-$(aq, 1.0 $moldm^{-3}$) \| Pt(s) | 1.61V |

19. 3,4 − dimethylhex − 3 − en − 2 − ol සංයෝගය සැලකූ විට පහත කුමන ප්‍රකාශය **<u>සත්‍ය</u>** වේද?
1. ත්‍රිමාන සමාවයවිකතාව නොදක්වයි.
2. HBr සමග ප්‍රතික්‍රියාවෙන් ලැබෙන ඵලය ප්‍රතිරූප අවයව සමාවයවිකතාව නොදක්වයි.
3. ප්‍රතිරූප අවයව සමාවයවිකතාව මෙන්ම පාරත්‍රිමාණ සමාවයවිකතාවය ද දක්වයි.
4. $PCl_3$ සමඟ ප්‍රතික්‍රියාවෙන් ලැබෙන ඵලය ප්‍රතිරූප අවයව සමාවයවිකතාව නොදක්වයි.
5. $Br_2(l)$ සමඟ ප්‍රතික්‍රියාවෙන් ලද ඵලය පාරත්‍රිමාණ සමාවයවිකතාව පෙන්වයි.

20. සාන්ද්‍රණය 0.36 mol $dm^{-3}$ වන $FeC_2O_4$ ජලීය ද්‍රාවණයකින් 25 $cm^3$ ක් ආම්ලික මාධ්‍යයේ දී සම්පූර්ණයෙන්ම ප්‍රතික්‍රියා කිරීමට අවශ්‍ය වන 0.10 mol $dm^{-3}$ ආම්ලික $K_2Cr_2O_7$ පරිමාව වනුයේ,

1. 450 $cm^3$ 2. 45 $cm^3$ 3. 135 $cm^3$ 4. 27 $cm^3$ 5. 270 $cm^3$

21. 298K දී 0.20 $moldm^{-3}$ NaOH ද්‍රාවණ 25.0 $cm^3$ කට 0.20 $moldm^{-3}$ $CH_3COOH$ ද්‍රාවණ 25.0 $cm^3$ ක් එක් කරන ලදී. ලැබෙන ද්‍රාවණය ජලය යොදා සිය ගුණයකින් තනුක කළවිට ලැබෙන ද්‍රාවණයේ $p^H$ අගය වනුයේ, 298 K දී Ka[$CH_3COOH$] = 1.0 x $10^{-5}$mol $dm^{-3}$.

1. 4 2. 5 3. 6 4. 7 5. 8

22. X ද්‍රව්‍ය ජලය සහ $CHCl_3$ තුල ව්‍යාප්ත වේ. 298K දී $CHCl_3$ $V_1$ $cm^3$ කට $C_1$ $moldm^{-3}$ X ජලීය ද්‍රාවණ $V_2$ $cm^3$ පරිමාවක් එක්කර හොඳින් මිශ්‍රකර සමතුලිතතාවයට පත්වීමට ඉඩ හරින ලදී. සමතුලිතතාවයේ දී ජලීය කලාපයේ X, $n_1$ mol ඇති බව සොයගන්නා ලදී. ජලය සහ $CHCl_3$ තුල X එකම අණුක ආකාරයේ පවතින අතර, X ජලය තුල දී විඝටනයට ලක්නොවන අතර, X ජලය සහ $CHCl_3$ සමඟ ප්‍රතික්‍රියා නොකරයි. ජලය සහ $CHCl_3$ අතර X හි ව්‍යාප්ති සංගුණකය වනුයේ,

1. $\frac{n_1V_1}{V_2(C_1-n_1)}$ 2. $\frac{n_1V_1}{V_2(C_1V_2 \times 10^{-3} - n_1)}$ 3. $\frac{n_1V_2}{V_1(C_1V_1 \times 10^{-3} - n_1)}$

4. $\frac{n_1V_2}{V_1(C_1V_1 - n_1)}$ 5. $\frac{n_1V_2}{V_1(C_1V_2 - n_1)}$

23.  පළමුව $C_2H_5MgBr$ සමග ප්‍රතික්‍රියා කරවා දෙවනුව තනුක $H_2SO_4$ යෙදූවිට ලැබෙන ඵලයන් වන්නේ,

1. 

2. 

3.  , $CH_3OH$

4.  , $CH_3OH$

5.  , $CH_3OH$

24. $TK$ හිදී $A$ හා $B$ සංශුද්ධ ද්‍රව දෙකක සංතෘප්ත වාෂ්ප පීඩන පිළිවෙලින් $P_A^0$ සහ $P_B^0$ වේ. $A$ හා $B$ ගෙන් සමන්විත ද්‍රාවණයක් රවුල් නියමය පිළිපදී. $A$ හා $B$ ද්‍රව මිශ්‍රණයක් එහි වාෂ්පයන් සමග සමතුලිතව ඇති විටක ද්‍රාවණය තුල $A$ හා $B$ අතර මවුල අනුපාතය $2:3$ වේ නම් වාෂ්ප කලාපයේ $A$ හි මවුල භාගය වනුයේ,

1. $\frac{2\,P_A^O}{5\,P_A^O + 2\,P_B^O}$ 2. $\frac{2\,P_A^O}{5\,P_A^O + 3\,P_B^O}$ 3. $\frac{2\,P_A^O}{3\,P_A^O + 2\,P_B^O}$ 4. $\frac{2\,P_A^O}{2\,P_A^O + 3\,P_B^O}$ 5. $\frac{3\,P_A^O}{2\,P_A^O + 3\,P_B^O}$

25. පහත ප්‍රතික්‍රියා අනුක්‍රමය සළකන්න.




A, B, C සහ D සඳහා ලැබෙන සංයෝගයන් පිළිවලින් වනුයේ,

1. 

2. 

3. 

4. 

5. 

26. 


$A$ හා $B$ ව්‍යුහයන් පිළිවෙලින් වනුයේ,

(1) 

(2) 

(3) 

(4) 

(5) 

27. පහත පරීක්ෂණ තොරතුරු සියල්ලටම පිළිතුරු ලබා දෙන්නේ කුමන සංයෝගයේද?

$A\ -\ HBr$ සමඟ ආකලන ප්‍රතික්‍රියාවක් සිදුකරයි.

$B\ -$ ජලීය $NaOH$ හමුවේ ස්වයං සංඝනනයට භාජනය වේ.

$C\ -$ පාරත්‍රිමාන සමාවයවිකතාව මෙන්ම ප්‍රතිරූප අවයව සමාවයවිකතාව දක්වයි.

1. $CH_3CH{=}CH-CH_2-\overset{\overset{O}{||}}{C}-CH_3$

2. $CH_3C\equiv C-CH_2-\overset{\overset{O}{||}}{C}-H$

3. $CH_3-\underset{\underset{OH}{|}}{\overset{\overset{H}{|}}{C}}-CH_2-\overset{\overset{O}{||}}{C}-CH_3$

4. $CH_3-\underset{\underset{OH}{|}}{\overset{\overset{Br}{|}}{C}}-CH=CH-CH_2-\overset{\overset{O}{||}}{C}-H$

5. $CH_3-\underset{\underset{CH_2CH_3}{|}}{\overset{\overset{OH}{|}}{C}}-C\equiv C-\overset{\overset{O}{||}}{C}-H$

28. ස්කන්ධය $9.0 \times 10^{-31}$ kg වන ඉලෙක්ට්‍රෝනයක ප්‍රවේගය $6 \times 10^{6}\ ms^{-1}$ වේ. මෙම ඉලෙක්ට්‍රෝනයේ ඩී-බ්‍රෝග්ලී තරංග ආයාමය වනුයේ,

1. $2.454 \times 10^{-12}$ nm
2. $2.454 \times 10^{-12}$ m
3. $1.227 \times 10^{-10}$ nm
4. $4.09 \times 10^{-13}$ m
5. $1.227 \times 10^{-10}$ m

29. 0.25 mol $dm^{-3}$ $Na_2SO_4$ ජලීය ද්‍රාවණයක් තුළින් $2.0A$ ධාරාවක් විනාඩි 3 ක් යැවූ විට ඇනෝඩයේ දී නිදහස්වන $O_2$ වායු පරිමාව සම්මත උෂ්ණත්වයේ දී කොපමණද? (ස.උ.පි. හිදී $O_2$ වායු $1\ mol$ ගන්නා පරිමාව $24\ dm^3$ ලෙස සළකන්න. ) $1F = 96500\ C\ mol^{-1}$

1. 0.022 $dm^3$
2. 0.090 $dm^3$
3. 0.90 $dm^3$
4. 0.36 $dm^3$
5. 0.088 $dm^3$

30. පහත ප්‍රතික්‍රියාව යාන්ත්‍රණ පියවරයන් ගෙන් නිවැරදි **<u>නොවන්නේ</u>** කුමක්ද?

1. 

2. 

3. $(CH_3)_3CCl + AlCl_3 \longrightarrow (CH_3)_3\overset{+}{C} + \overline{Al}Cl_4$

4. 

5. 

- අංක 31 සිට 40 තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති (a), (b), (c) සහ (d) යන ප්‍රතිචාර හතර අතුරෙන් එකක් හෝ වැඩි සංඛ්‍යාවක් හෝ නිවැරදිය. **<u>නිවැරදි ප්‍රතිචාරය / ප්‍රතිචාර</u>** කවරේ දැයි තෝරා ගන්න.

(a) සහ ( b) පමණක් නිවැරදි නම් ( 1 ) මත ද
(b) සහ ( c) පමණක් නිවැරදි නම් ( 2 ) මත ද
(c) සහ ( d) පමණක් නිවැරදි නම් ( 3 ) මත ද
(a) සහ (d) පමණක් නිවැරදි නම් ( 4 ) මත ද
වෙනත් ප්‍රතිචාර සංඛ්‍යාවක් හෝ සංයෝජනයක් හෝ නිවැරදි නම් (5) මත ද උත්තර පත්‍රයෙහි දැක්වෙන උපදෙස් පරිදි ලකුණු කරන්න.

ඉහත උපදෙස් සම්පිණ්ඩනය

| 1 | 2 | 3 | 4 | 5 |
|---|---|---|---|---|
| (a) සහ (b) පමණක් නිවැරදියි | (b) සහ (c) පමණක් නිවැරදියි | (c) සහ (d) පමණක් නිවැරදියි | (d) සහ (a) පමණක් නිවැරදියි | වෙනත් ප්‍රතිචාර සංඛ්‍යාවක් හෝ සංයෝජනයක් හෝ නිවැරදියි |

31. $NO_3^-$ අයනයට සම ඉලෙක්ට්‍රොනික වන්නේ පහත කුමන අණුවද? / අණු ද?

a) $BF_3$ (b) $NO_2$ (c) MgS (d) $SO_2$

32. ආසන්න වශයෙන් සමාන වර්ණ සහිත සංකීර්ණ අයන වන්නේ,

(a) $[Co(NH_3)_6]^{2+}(aq)$ (b) $[Zn(NH_3)_6]^{2+}(aq)$
(c) $[CoCl_4]^{2-}(aq)$ (d) $[Ni(NH_3)_6]^{2+}(aq)$

33. CO(g) + $3H_2(g) \rightleftharpoons CH_4(g) + H_2O(g)$ යන ප්‍රතිවර්ත්‍ය ප්‍රතික්‍රියාවේ $TK$ දී සමතුලිතතා නියතය $K_C = 3.92\, dm^6\, mol^{-2}$ වේ. $TK$ දී $CO(g)\ 1\, mol$, $H_2 3.0\, mol$, $CH_4(g)\ 1\, mol$, $H_2O\ (g) 2\, mol$ $1\, dm^3$ දෘඪ බඳුනක මිශ්‍ර කරන ලදී. ඉහත පද්ධතිය පිළිබඳ පහත කවර ප්‍රකාශනය / ප්‍රකාශ **සත්‍ය** වේද?

(a) ප්‍රතික්‍රියා සංගුණකය $Q_C < K_C$ වන අතර ප්‍රතික්‍රියාව වමට ගමන් කරමින් පවතී.
(b) ප්‍රතික්‍රියා සංගුණකය $Q_C > K_C$ වන අතර ප්‍රතික්‍රියාව දකුණට ගමන් කරමින් පවතී.
(c) ප්‍රතික්‍රියා සංගුණකය $Q_C = K_C$ වන අතර ප්‍රතික්‍රියාව ගතික සමතුලිතයේ පවතී.
(d) ප්‍රතික්‍රියා සංගුණකය $Q_C < K_C$ වන අතර ප්‍රතික්‍රියාව දකුණට ගමන් කරමින් පවතී.

34. $Fe^{3+}$ හා $I^-$ අතර ප්‍රතික්‍රියාව සඳහා $Fe^{3+}$ වලට සාපේක්ෂව, ප්‍රතික්‍රියාවේ පෙළ පරීක්ෂණාත්මකව නිර්ණය කරන පරීක්ෂණය සම්බන්ධයෙන් පහත කුමන ප්‍රකාශ / ප්‍රකාශය **සත්‍ය** වේද?

(a) මෙම ප්‍රතික්‍රියාවේ සීඝ්‍රතාවය නිර්ණය කිරීම සඳහා සෑදෙන $I_2$ ප්‍රමාණය භාවිතා කළ හැකිය.
(b) ඉතා කුඩා $I_2\ (aq)$ සාන්ද්‍රණයක දී පිෂ්ට ද්‍රාවණයක් නිල් පැහැ වන බැවින්, $Na_2S_2O_3$ යොදා ගනිමින් නිල් පැහැවීමට ගතවන කාලය ප්‍රමාද කළ යුතුය.
(c) $Na_2S_2O_3\ (aq)$ හා $I_2(aq)$ අතර ප්‍රතික්‍රියාව ඉතා සෙමින් සිදුවන ප්‍රතික්‍රියාවකි.
(d) මෙම පරීක්ෂණය සිදු කිරීමේ දී පළමුව $Fe^{3+}$ (aq) හා $I^-\ (aq)$ එක් බීකරයකට ද $H_2SO_4$ හා $Na_2S_2O_3$ තවත් බීකරයකට ද ගෙන ඒවා මිශ්‍ර කරයි.

35. පහත කුමන ප්‍රකාශය / ප්‍රකාශ **සත්‍ය** වේද?

(a) ස්වභාවික රබර්වල ඒක අවයවිකය $cis - polyisoprene$ වේ.
(b) ස්වභාවික රබර්වල ඇදීමේ ගුණයට හේතුව cis - පොලිඅයිසොප්‍රීන් දාම තිබීමයි.
(c) බර අනුව 1% - 3% ක් අතර සල්ෆර් ප්‍රමාණයකින් යොදා රත් කිරීම රබර් වල්කනයිස් කිරීම ලෙස හඳුන්වයි.
(d) පොලි අයිසොප්‍රීන් දාම අතර S මගින් හරස් බන්ධන සාදන නිසා රබර්වල ප්‍රත්‍යස්ථ ගුණය වැඩි වේ.

36. නිල් ලිට්මස් රතු පැහැවන්නේ පහත කවර ජලීය ද්‍රාවණය ද / ද්‍රාවණ ද?

(a) $(NH_4)_2SO_4$ (b) $CH_3COONa$ (c) $NH_4Cl$ (d) $CaCl_2$

37. X , $(CH_3)_3$ , CCl සහ $Y, CH_3CH_2Cl$ සංයෝග සම්බන්ධයෙන් වඩාත් **නිවැරදි** වන්නේ පහත කුමන ප්‍රකාශයද? / ප්‍රකාශ ද?

(a) X හි නියුක්ලියෝෆිලික ආදේශ ප්‍රතික්‍රියාවල සීඝ්‍රතාව Y වලට වඩා වැඩිවේ.
(b) Y හි නියුක්ලියෝෆිලික ආදේශ ප්‍රතික්‍රියාවල සීඝ්‍රතාව X වලට වඩා වැඩිවේ.
(c) X ට තනි පියවරේ ප්‍රතික්‍රියා යාන්ත්‍රණයක් ඇති අතර Y ට දෙපියවර යාන්ත්‍රණයක් පවතී.
(d) X සහ Y $NaOH(aq)$ සමඟ ප්‍රතික්‍රියාවෙන් ලැබෙන ඵලයට $H^+ / KMnO_4$ දැමූ විට $Y$ පමණක් $H^+ / KMnO_4$ හි වර්ණය අවර්ණ කරයි.

38. $TK$ නියත උෂ්ණත්වයේ පවතින $A_2(g) \rightleftharpoons B(g) + C(g)$ යන ප්‍රතික්‍රියාවෙහි ඉදිරි ප්‍රතික්‍රියාවට හිතකර වන්නේ පහත කුමන ක්‍රියාවක්ද? / ක්‍රියාවන්ද?

(a) නියත පීඩනයේ දි උච්ච වායුවකින් යම් ප්‍රමාණයක් පද්ධතියට එක් කිරීම.
(b) නියත පරිමාවේ දී $A(g)$ යම් ප්‍රමාණයක් පද්ධතියට එක් කිරීම.
(c) නියත පරිමාවේ දී $B(g)$ යම් ප්‍රමාණයක් පද්ධතියට එක් කිරීම.
(d) නියත පරිමාවේ දී උච්ච වායුවකින් යම් ප්‍රමාණයක් පද්ධතියට එක් කිරීම.

39. විද්‍යුත් විච්ඡේද්‍යයක ද්‍රවණයක සන්නායකතාව කෙරෙහි පහත කවර සාධක බලපායිද?

(a) ද්‍රව්‍යයේ සාන්ද්‍රණය (b) ද්‍රාවණය තුළ පවතින අයනවල වේගය
(c) විද්‍යුත් ක්ෂේත්‍රයේ විභව අනුක්‍රමණය (d) උෂ්ණත්වය

40. පහත කුමන ප්‍රකාශය / ප්‍රකාශ **අසත්‍ය වේද?**

(a) 2 වන කාණ්ඩයේ නයිට්‍රේටවල තාප ස්ථායිතාව කාණ්ඩය ඔස්සේ පහළට යත්ම වැඩිවේ.
(b) d ගොනු නොවන ආවර්තයක ආවර්තයක් ඔස්සේ වමේ සිට දකුණට යත්ම හයිඩ්‍රොක්සයිඩ වල ආම්ලික ගුණ අඩුවේ.
(c) 15 කාණ්ඩයේ හේලයිඩවල ජල විච්ඡේදන හැකියාව කාණ්ඩය ඔස්සේ පහළට වැඩිවේ.
(d) දෙවන කාණ්ඩයේ හයිඩ්‍රොක්සයිඩවල ජල ද්‍රාව්‍යතාවය කාණ්ඩය ඔස්සේ පහළට වැඩිවේ.

- අංක 41 සිට 50 තෙක් එක් ප්‍රශ්නයක් සඳහා ප්‍රකාශ දෙකක් ඉදිරිපත් කර ඇත. එම ප්‍රකාශ යුගලම හොඳින්ම ගැලපෙනුයේ පහත දැක්වෙන පරිදි **(1), (2), (3), (4)** සහ **(5)** යන ප්‍රතිචාර වලින් කවර ප්‍රතිචාරය දැයි තෝරා උත්තර පත්‍රයේ උචිත ලෙස ලකුණු කරන්න.

| ප්‍රතිචාරය | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| 1 | සත්‍යය | සත්‍ය වන අතර පළමු ප්‍රකාශය නිවැරදිව පහදා දෙයි |
| 2 | සත්‍යය | සත්‍ය වන අතර පළමු ප්‍රකාශය නිවැරදිව පහදා නොදේ |
| 3 | සත්‍යය | අසත්‍යය |
| 4 | අසත්‍යය | සත්‍යය |
| 5 | අසත්‍යය | අසත්‍යය |

| | පළමු ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| 41. | $KIO_3$ සහ $H^+ / KI$ භාවිතා කර $Na_2S_2O_3$ ද්‍රාවණයක් ප්‍රමාණීකරණය කරයි. | $KIO_3$ සහ $H^+ / KI$ ප්‍රතික්‍රියාවෙන් $I_2$ ලබා දෙයි. |
| 42. | බොහොමයක් වූ සගන්ධ තෙල් ශාකවලින් නිස්සාරණය සඳහා හුමාල ආසවනය භාවිත කරයි. | හුමාල ආසවනයේ දී පද්ධතියේ මුලු පීඩනය = තෙල්වල වාෂ්ප පීඩනය + ජලයේ වාෂ්ප පීඩනය නිසා 100 $^0C$ ට අඩු උෂ්ණත්වයක දී ආසවනය වෙන් කර ගත හැක. |
| 43. | බෙන්සීන්වලට වඩා ඇනිලීන්වල ඉලෙක්ට්‍රොෆිලික ආකලන ප්‍රතික්‍රියාශීලිතාව වැඩිවේ. | ඇනිලීන්හි N මත ඇති එකසර ඉලෙක්ට්‍රෝන යුගලය සම්ප්‍රයුක්තතාව මඟින් ඇරොමැටික වලය මතට විස්ථානගත වේ. |
| 44. | $Ca(OH)_2\,(s)$ ජලයේ මඳ වශයෙන් දියවන අතර $CaCl_2(s)$ ජලයේ ඉතා හොඳින් දියවේ. | අයනික සංයෝග සියල්ල ජලයේ හොඳින් ද්‍රාව්‍ය වේ. |
| 45. | $NaCl$ වලට වඩා KCl වල සහ සංයුජ ලක්ෂණ වැඩිය. | $Na^+$ අයනයේ ධ්‍රැවීකරණ බලය $K^+$ අයනයේ ධ්‍රැවීකරණ බලයට වඩා වැඩිය. |
| 46. | $NH_3$ , $Mg$ සමඟ ප්‍රතික්‍රියාවෙන් $Mg_3N_2$ සහ $H_2$ වායුව පිට කරයි. | $NH_3$ දුබල ඔක්සිහාරකයක් ලෙස ක්‍රියා කරයි. |
| 47. | වායුගෝලයේ $CO_2$ ප්‍රතිශතය ඉහළ නිසා අම්ල වැසි කෙරෙහි වැඩිම දායකත්වයක් සපයන්නේ $CO_2$ වායුවයි. | $CO_2$ ජලයේ දී $H_2CO_3$ ද්විභාස්මික අම්ලය සාදයි. |
| 48. | ආම්ලික මාධ්‍යයේ දී $H_2S$ යැවීමෙන් $Co^{2+}$ සහ $Ni^{2+}$ අවක්ෂේප කරගත නොහැක. | ආම්ලික මාධ්‍ය තුළදී $S^{2-}$ අයන සාන්ද්‍රණය අඩු නිසා එය $Ni^{2+}$ , $Co^{2+}$ අවක්ෂේප කිරීමට ප්‍රමාණවත් නොවේ. |
| 49. | ප්‍රතික්‍රියාවක සීඝ්‍රතාවය උත්ප්‍රේරකයක් එක්කිරීමෙන් වැඩිවේ. | ප්‍රතික්‍රියාවේ සක්‍රියන ශක්තිය උත්ප්‍රේරකයක් එක් කිරීමෙන් වැඩිවේ. |
| 50. | වායුවක හැඩය (ගුරුත්වය) නිශ්චිත නොවේ. | වායු අංශු අතර අන්තර් අණුක ආකර්ශණ බල ඉතා දුබල බැවින් ගුරුත්වය අභිබවා චලනය විය හැක. |

**ආවර්තිතා වගුව**
**ஆவர்த்தன அட்டவணை**
**Periodic Table**

| | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 1 H | | | | | | | | | | | | | | | | | 2 He |
| 2 | 3 Li | 4 Be | | | | | | | | | | | 5 B | 6 C | 7 N | 8 O | 9 F | 10 Ne |
| 3 | 11 Na | 12 Mg | | | | | | | | | | | 13 Al | 14 Si | 15 P | 16 S | 17 Cl | 18 Ar |
| 4 | 19 K | 20 Ca | 21 Sc | 22 Ti | 23 V | 24 Cr | 25 Mn | 26 Fe | 27 Co | 28 Ni | 29 Cu | 30 Zn | 31 Ga | 32 Ge | 33 As | 34 Se | 35 Br | 36 Kr |
| 5 | 37 Rb | 38 Sr | 39 Y | 40 Zr | 41 Nb | 42 Mo | 43 Tc | 44 Ru | 45 Rh | 46 Pd | 47 Ag | 48 Cd | 49 In | 50 Sn | 51 Sb | 52 Te | 53 I | 54 Xe |
| 6 | 55 Cs | 56 Ba | La-Lu | 72 Hf | 73 Ta | 74 W | 75 Re | 76 Os | 77 Ir | 78 Pt | 79 Au | 80 Hg | 81 Tl | 82 Pb | 83 Bi | 84 Po | 85 At | 86 Rn |
| 7 | 87 Fr | 88 Ra | Ac-Lr | 104 Rf | 105 Db | 106 Sg | 107 Bh | 108 Hs | 109 Mt | 110 Uun | 111 Uuu | 112 Uub | 113 Uut | | | | | |

| | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 57 La | 58 Ce | 59 Pr | 60 Nd | 61 Pm | 62 Sm | 63 Eu | 64 Gd | 65 Tb | 66 Dy | 67 Ho | 68 Er | 69 Tm | 70 Yb | 71 Lu |
| 89 Ac | 90 Th | 91 Pa | 92 U | 93 Np | 94 Pu | 95 Am | 96 Cm | 97 Bk | 98 Cf | 99 Es | 100 Fm | 101 Md | 102 No | 103 Lr |

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education NWP වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

| 02 | S | II |
|---|---|---|

## තුන්වන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2019
## Third Term Test - Grade 13 - 2019

විභාග අංකය .............................

## රසායන විද්‍යාව II

කාලය පැය තුනයි

* ආවර්තිතා වගවක් අවසාන පිටුවෙහි සපයා ඇත.
* **ගණක යන්ත්‍ර භාවිතයට ඉඩ දෙනු නොලැබේ.**
* සාර්වත්‍ර වායු නියතය, $R = 8.314\ \text{J K}^{-1}\ \text{mol}^{-1}$
* ඇවගාඩ්රෝ නියතය, $N_A = 6.022 \times 10^{23}\ \text{mol}^{-1}$

**මෙම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමේ දී ඇල්කයිල් කාණ්ඩ සංක්ෂිප්ත ආකාරයකින් නිරූපණය කළ හැකි ය.**

උදාහරණය:  කාණ්ඩය $CH_3CH_2-$ ලෙස දැක්විය හැකි ය.

- **A කොටස - ව්‍යුහගත රචනා**

* **සියලු ම** ප්‍රශ්නවලට මෙම ප්‍රශ්න පත්‍රයේ ම පිළිතුරු සපයන්න.
* ඔබේ පිළිතුරු එක් එක් ප්‍රශ්නයට ඉඩ සලසා ඇති තැන්වල ලිවිය යුතු ය. මේ ඉඩ ප්‍රමාණය පිළිතුරු ලිවීමට ප්‍රමාණවත් බව ද දීර්ඝ පිළිතුරු බලාපොරොත්තු නො වන බව ද සලකන්න.

- **B කොටස සහ C කොටස - රචනා**

* එක් එක් කොටසින් ප්‍රශ්න **දෙක** බැගින් තෝරා ගනිමින් ප්‍රශ්න **හතරකට** පිළිතුරු සපයන්න. මේ සඳහා සපයනු ලබන කඩදාසි භාවිත කරන්න.
* සම්පූර්ණ ප්‍රශ්න පත්‍රයට නියමිත කාලය අවසන් වූ පසු **A**, **B** සහ **C** කොටස්වලට පිළිතුරු, **A** කොටස මුලින් තිබෙන පරිදි එක් පිළිතුරු පත්‍රයක් වන සේ අමුණා විභාග ශාලාධිපතිට භාර දෙන්න.
* ප්‍රශ්න පත්‍රයෙහි **B** සහ **C** කොටස් **පමණක්** විභාග ශාලාවෙන් පිටතට ගෙන යා හැකි ය.

**පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා පමණි**

| කොටස | ප්‍රශ්න අංකය | ලැබූ ලකුණු |
|---|---|---|
| A | 1 | |
| | 2 | |
| | 3 | |
| | 4 | |
| B | 5 | |
| | 6 | |
| | 7 | |
| C | 8 | |
| | 9 | |
| | 10 | |
| එකතුව | | |
| ප්‍රතිශතය | | |

**අවසාන ලකුණු**

| | |
|---|---|
| ඉලක්කමෙන් | |
| අකුරින් | |

**සංකේත අංක**

| | |
|---|---|
| උත්තර පත්‍ර පරීක්ෂක 1 | |
| උත්තර පත්‍ර පරීක්ෂක 2 | |
| පරීක්ෂා කළේ : | |
| අධීක්ෂණය කළේ : | |

[දෙවැනි පිටුව බලන්න.

## A කොටස - ව්‍යුහගත රචනා

(01) (a) පහත මූලද්‍රව්‍ය සළකන්න.

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| Li | Be | B | C | N | O | F |
| Na | Mg | Al | Si | P | S | Cl |

(i) ඉහත මූලද්‍රව්‍ය අතුරෙන් පහත ගුණ පෙන්වන මූලද්‍රව්‍ය හඳුනාගෙන ඒවායේ රසායනික සංකේතය ලියන්න.

1. ඉහළම ප්‍රථම අයනීකරණ ශක්තිය ඇත්තේ, ....................................
2. ඉහළම ඔක්සිකරණ අවස්ථාව ඇත්තේ ....................................
3. විශාලතම ඇනායනය සාදන්නේ ....................................
4. එක් බහුරූපී ආකාරයක් $X_{60}$ ආකාරයේ වන බහුරූපී ආකාර සාදන මූලද්‍රව්‍ය ....................................

(ii) ඉහත එක් මූලද්‍රව්‍යයක් හයිඩ්‍රජන් සමඟ උභයගුණී ස්වභාවයේ හයිඩ්‍රයිඩයක් සාදයි. එහි උභයගුණී ස්වභාවය පෙන්වීමට සමීකරණ 2ක් ලියන්න.

..........................................................................................................................................

..........................................................................................................................................

(iii) ඉහත (a) මූලද්‍රව්‍ය අතරින් හැලජන සාදන හයිඩ්‍රයිඩ වල ආම්ලික ස්වභාවය සන්සන්දනය කරන්න.

..........................................................................................................................................

..........................................................................................................................................

(iv) $N$ වල ක්ලෝරයිඩයේ ජලවිච්ඡේදනයේ ඵල ලියා දක්වන්න.

..........................................................................................................................................

..........................................................................................................................................

(b) Chlorine nitrate යනු ස්තරගෝලයේ ඇති වායුවකි. මෙම වායුව ඕසෝන් ස්තරය ක්ෂය වීමට දායකත්වයක් දරයි. ඉහත වායුව පහත ප්‍රතික්‍රියාවෙන් නිපදවේ.

$Cl_2O + N_2O_5 \rightarrow 2\,ClONO_2$

i. $ClONO_2$ හි සැකිලි ව්‍යුහය පහත දක්වා ඇත.




X හා Y හඳුන්වන්න.

X ..........................................................................................................................................

Y ..........................................................................................................................................

ii. 1. පහත සංයෝගවල IUPAC නාමයන් ලියන්න.

$Cl_2O$ ..........................................................................................................................

$N_2O_5$ ..........................................................................................................................

2. $ClONO_2$ සඳහා වඩාත් ස්ථායි ලුවිස් ව්‍යුහය අඳින්න.

3. ඉහත (2) හි ව්‍යුහය සඳහා සම්ප්‍රයුක්ත ව්‍යුහ අඳින්න. ඒවායේ ස්ථායිතාව පිළිබඳව අදහස් දක්වන්න.

4. ඉහත (3) කොටසෙහි ඇඳි සම්ප්‍රයුක්ත ව්‍යුහ වලින් සත්‍ය ව්‍යුහයට වැඩිම දායකත්වයක් දක්වන ව්‍යුහය / ව්‍යුහයන් වන්නේ,

.............................................................................................................................................................

.............................................................................................................................................................

5. VSEPR වාදය භාවිතයෙන් පහත පරමාණු වටා හැඩය අපෝහනය කරන්න.

i. N

ii. Cl හා සම්බන්ධිත O

6. පහත දී ඇති වගුවෙහි,

i. පරමාණුව වටා ඉලෙක්ට්‍රෝන යුගල ජ්‍යාමිතිය (ඉලෙක්ට්‍රෝන යුගල සැකසුම)

ii. පරමාණුවේ මුහුම්කරණය

iii. පරමාණුවේ ඔක්සිකරණ අංකය සඳහන් කරන්න.

| | N | Cl හා සම්බන්ධිත O |
|---|---|---|
| i. පරමාණුව වටා ඉලෙක්ට්‍රෝන යුගල ජ්‍යාමිතිය | | |
| ii. පරමාණුවේ මුහුම්කරණය | | |
| iii. පරමාණුවේ ඔක්සිකරණ අංකය | | |

(C) පහත (i) - (iv) දක්වා වරහන් තුළ දක්වා ඇති අදාල ගුණය ආරෝහණය වන පිළිවෙලට දක්වන්න.

(i) $MnO_4^-$ , $PO_3F^-$ , $NO_2$ , $SO_3$ ( සම්ප්‍රයුක්ත ව්‍යුහ සංඛ්‍යාව)

...................... < ...................... < ...................... < ......................

(ii) Rb , C$a$ , Si , Al ( ද්‍රවාංකය)

...................... < ...................... < ...................... < ......................

(iii) $Mg(NO_3)_2$ , $Sr(NO_3)_2$ , $Ba(NO_3)_2$ , $Ca(NO_3)_2$ ( වියෝජන උෂ්ණත්වය)

...................... < ...................... < ...................... < ......................

(iv) $N_2O_3$ , $P_4O_6$ , $Sb_4O_6$ , $Bi_2O_3$ ( ආම්ලික ගුණය)

...................... < ...................... < ...................... < ......................

(02) (a)

- A යනු S ගොනුවේ මූලද්‍රව්‍යයක් වන අතර ත. $H_2SO_4$ සමග B ලවණය හා C වායුව ලබා දේ.
- B පහන්සිළු පරීක්ෂාවට දම් පැහැ වර්ණයක් ලබා දෙන අතර, A ඔක්සිජන් තුළ දහනය කිරීමෙන් D සුපර් ඔක්සයිඩය ලබා දේ.
- D ජලය සමග ප්‍රතික්‍රියාවෙන් $H^+$ / $KMnO_4$ හි දම් පැහැය, අවර්ණ කරන E නම් ඵලය ලබා දේ.
- C වායුව F නම් අලෝහය සමග රත් කිරීමෙන් G වායුව ලබා දේ.
- G වායුව $H^+$ / $K_2Cr_2O_7$ හි තැඹිලි පැහැය කොළ පැහැයට හරවයි.
- G, F හි ඔක්සයිඩයක් සමග ප්‍රතික්‍රියා කර ඵලයක් ලෙස F ලබා දේ.

(i) A, B, C, D, E, F, හා G හඳුනාගන්න.

A : ……………………… B : ……………………… C : ………………………

D : ……………………… E : ……………………… F : ………………………

G : ………………………

(ii) පහත තුලිත රසායනික සමීකරණ ලියා දක්වන්න.

A + තනුක $H_2SO_4 \rightarrow$

A + $O_2(g) \rightarrow$

D + $H_2O\ (l) \rightarrow$

C + $F \rightarrow$

G + F හි ඔක්සයිඩය $\rightarrow$

(iii) පහත ප්‍රතික්‍රියාවලට අදාළ තුලිත අයනික සමීකරණ ලියා දක්වන්න.

$H^+ / KMnO_4$ හා E අතර ප්‍රතික්‍රියාව

$H^+ / K_2Cr_2O_7$ හා G අතර ප්‍රතික්‍රියාව

(b) ඉහත (i) හි C වායුව $P$ ගොනුවේ $X$ නම් ද්වි පරමාණුක වායුවක් සමඟ ප්‍රතික්‍රියාවෙන් ඔක්සිකාරකයක් ලෙස හා ඔක්සිහාරකයක් ලෙස ක්‍රියා කරන $Y$ ඵලයක් ලබා දේ.

(i) $C + X \rightarrow Y$ ප්‍රතික්‍රියාව සඳහා තුලිත රසායනික සමීකරණය ලියන්න.

(ii) පහත ඒවා සඳහා තුලිත රසායනික සමීකරණය බැගින් ලියන්න.

1. $Y$ ඔක්සිකාරකයක් ලෙස

2. $Y$ ඔක්සිහාරකයක් ලෙස

(iii) $Y$ අම්ලයක් ලෙස ක්‍රියා කරන අවස්ථාවක් සඳහා සහ හස්මයක් ලෙස ක්‍රියා කරන අවස්ථාවක් සඳහා තුලිත සමීකරණය බැගින් ලියන්න.

(c) පරීක්ෂණ නළ 5ක A, B, C, D සහ E යන ජලීය ද්‍රාවණ අඩංගු වේ. එම ද්‍රාවණ $Na_2S_2O_3$ , NaI , $NaNO_3$ , $NH_4SCN$ හා $Na_2SO_3$ වේ. (පිළිවෙලින් නොවේ.) එක් එක් ද්‍රාවණය හඳුනා ගැනීම සඳහා කරන ලද පරීක්ෂණ හා නිරීක්ෂණ පහත දක්වා ඇත. මෙම තොරතුරු භාවිතයෙන් A,B,C,D සහ E ද්‍රාවණ හඳුනා ගන්න.

| | **පරීක්ෂණය** | **නිරීක්ෂණය** |
|---|---|---|
| A | i. Al කුඩු හා NaOH සමග රත් කිරීම<br>ii. පිටවන වායුව HCl වාෂ්පයෙන් පරීක්ෂා කිරීම. | අවර්ණ වායුවක් පිටවේ<br>සුදු පැහැ දුමාරයක් ලබා දේ. |
| B | ද්‍රාවණයට $FeCl_3$ එක් කිරීම. | තද රතු පැහැති ද්‍රාවණයක් ලැබේ. |
| C | i. ජලීය ද්‍රාවණයට $BaCl_2$ ද්‍රාවණයක් එක් කිරීම.<br>ii. වෙන් කර ගන්නා ලද අවක්ෂේපයට තනුක HCl එකතු කිරීම. | සුදු පැහැ අවක්ෂේපයක් ලබා දේ.<br>අවක්ෂේපය දියවේ. |
| D | ජලීය ද්‍රාවණයට $CH_3(COO)_2$ Pb ස්වල්පයක් එක් කිරීම. | සුදු පැහැ අවක්ෂේපයක් ලබා දේ. අවක්ෂේපය රත් කිරීමේ දී කළු පැහැ වේ. |
| E | i. ජලීය ද්‍රාවණයට සා. $HNO_3$ හා $AgNO_3$ එක් කිරීම.<br>ii. සාන්ද්‍ර ඇමෝනියා එක් කිරීම. | කහ පැහැයට හුරු අවක්ෂේපයක් ලැබේ.<br>අවක්ෂේපය ද්‍රාවණය නොවේ. |

A ...................................................................... B ......................................................................

C ...................................................................... D ......................................................................

E ......................................................................

(03) (a) (i) දුබල ඒක භාස්මික අම්ලයක් වන $HA$ එහි සංයුග්මක හස්මය වන $NaA$ සමග මිශ්‍ර කිරීමෙන් සාදා ඇති ද්‍රාවණයක $pH$ අගය $pH = P^{K_a} + log_{10} \frac{[A^- (aq)]}{[HA (aq)]}$ බව පෙන්වන්න.

$K_a - HA$ අම්ලයේ විඝටන නියතය.

(ii) එක්තරා උෂ්ණත්වයක දී HA අම්ලයේ 0.002 mol ක් ජලයෙහි ද්‍රාවණය කර එම ද්‍රාවණ පරිමාව $100\ cm^3$ ක් වන තුරු තනුක කරන ලදී. එයට $0.02\ mol\ dm^{-3}$ NaOH ද්‍රාවණයකින් $50\ cm^3$ ක් එක් කළ විට ලැබෙන ද්‍රාවණයේ pH අගය 5 ක් විය. එම උෂ්ණත්වයේ දී HA අම්ලයේ විඝටන නියතය $K_a$ ගණනය කරන්න.

(b) A හා B නමැති සංයෝග 2ක් අතර සිදුවන ප්‍රතික්‍රියාව පහත දැක්වේ.

$$A(aq) + 2B(aq) \rightarrow 3D(aq)$$

ආරම්භක A හි හා B හි සාන්ද්‍රණ වෙනස් කරමින් කරන ලද පරීක්ෂණයක දී ලත් ප්‍රතිඵල පහත වගුවේ දක්වා ඇත.

| පරීක්ෂණ අංකය | $(A(aq))/\ mol\ dm^{-3}$ | $(B(aq))\ /\ mol\ dm^{-3}$ | ආරම්භක සීඝ්‍රතාවය $mol\ dm^{-3}\ s^{-1}$ | |
|---|---|---|---|---|
| | | | 300 K | 320 K |
| 1 | $2.5 \times 10^{-4}$ | $3 \times 10^{-5}$ | $5 \times 10^{-4}$ | $2 \times 10^{-3}$ |
| 2 | $5.0 \times 10^{-4}$ | $6 \times 10^{-5}$ | $4 \times 10^{-3}$ | - |
| 3 | $1.0 \times 10^{-4}$ | $6 \times 10^{-5}$ | $1.6 \times 10^{-2}$ | - |

(i) එම ප්‍රතික්‍රියාවේ සීඝ්‍රතාවය සඳහා වේග ප්‍රකාශනයක් ලියන්න.

(ii) ඉහත දත්ත ඇසුරින් 300 K දී ප්‍රතික්‍රියාවේ සීඝ්‍රතාවය සඳහා වේග ප්‍රකාශනය ලබාගන්න.

(iii) මෙම ප්‍රතික්‍රියාවේ සමස්ථ පෙළ කුමක්ද?

(iv) මෙම ප්‍රතික්‍රියාවේ සීඝ්‍රතා නියතය ගණනය කරන්න.

(v) පළමු පරීක්ෂණයේ දී උෂ්ණත්වය වැඩි කළ විට ප්‍රතික්‍රියාවේ සීඝ්‍රතාවය ද වැඩිවේ. එයට හේතුව බෝල්ස්ට්මාන් ව්‍යාප්ති වක්‍රය ඇසුරින් පහදා දෙන්න.

(vi) මෙම ප්‍රතික්‍රියාවේ සීඝ්‍රතාවය වැඩි කළ හැකි වෙනත් ආකාර 02ක් සඳහන් කරන්න.

(04) (a) A, B හා C යනු අනුක සූත්‍රය $C_4H_{10}O$ වූ එකිනෙකෙහි සමාවයවික වන සංයෝග තුනකි. B පමණක් ප්‍රකාශ සමාවයවිකතාව පෙන්වන අතර A හා B පමණක් PCC (පිරිඩීනියම් ක්ලෝරෝ ක්‍රෝමේට්) සමඟ ප්‍රතික්‍රියා කර පිළිවෙලින් D හා E සංයෝග සාදයි.

(i) A, B, C, D හා E ව්‍යුහ පහත දී ඇති කොටු තුළ අඳින්න.

A

B

C

D

E

(ii) D හා E සංයෝග වියළි ඊතර මාධ්‍යයේ $CH_3MgBr$ සමඟ ප්‍රතික්‍රියා කරවා ජල විච්ඡේදනය කළ විට X හා Y සංයෝග සාදයි.

1. D හා E සංයෝග ඉහත ප්‍රතික්‍රියාවට අනුව සාදන X හා Y හි ව්‍යුහ අඳින්න.

D. $\xrightarrow[\text{II. } H^+ / H_2O]{\text{I. } CH_3MgBr / \text{ වියළි ඊතර}}$ X ;

E. $\xrightarrow[\text{II. } H^+ / H_2O]{\text{I. } CH_3MgBr / \text{ වියළි ඊතර}}$ Y ;

2. ඉහත D හා E සිදුකරන ප්‍රතික්‍රියා වර්ග / වර්ගය පහත ආකාරවලින් කුමක්ද?

(ඉලෙක්ට්‍රෝෆිලික ආකලන $A_E$ , ඉලෙක්ට්‍රෝෆිලික ආදේශ $S_E$, නියුක්ලියෝෆිලික ආකලන $A_N$, නියුක්ලියෝෆිලික ආදේශ $S_N$ ඉවත්වීමේ E)

| D | | E | |
|---|---|---|---|
| | | | |

(iii) ඉහත සෑදෙන *X* හා *Y* සංයෝග එකිනෙකින් වෙන් කර හඳුනා ගැනීම සඳහා භාවිතා කළ හැකි සරල පරීක්ෂාවක් එහි නිරීක්ෂණ සමඟ දෙන්න.

(b) පහත දැක්වෙන ප්‍රතික්‍රියාවලින් ලැබෙන ප්‍රධාන ඵලයේ ව්‍යුහය අදාළ කොටුව තුළ අඳින්න.

(i) $CH_3-\underset{\displaystyle C_2H_5}{\underset{|}{C}H}-CH_2-Br \xrightarrow{\text{ජලීය } NaOH}$ [ ]

(ii) $CH_2=CH-CH_2-CH_3 \xrightarrow[\text{HBr / මාධ්‍යයේ}]{\text{පෙරොක්සයිඩ}}$ [ ]

(iii) $CH_3-\overset{\displaystyle O}{\overset{\|}{C}}-CH_2COOH \xrightarrow[\text{II. } H^+H_2O]{\text{I. } NaBH_4}$ [ ]

(iv) $CH_3 - C \equiv C - CH_3 \xrightarrow[60^0\,C]{Hg^{2+}\,/\,ත.H_2SO_4}$ [ ]

(v) $C_6H_5 - NH_2 \xrightarrow[(0-5)^0\,C]{NaNO_2\,/\,HCl}$ [ ]

(C) $A$ නමැති සරළම ඇරොමැටික හයිඩ්‍රොකාබනය පහත ප්‍රතික්‍රියා ශ්‍රේණියට සහභාගි වේ.




(i) $A, B, C$ හා $D$ හි ව්‍යුහ පහත කොටු තුල අඳින්න.

| A | B | C | D |
|---|---|---|---|
| | | | |

(ii) A සංයෝගය සා. $HNO_3$ / සා. $H_2SO_4$ සමඟ $50^0$ C උෂ්ණත්වයේ දී ප්‍රතික්‍රියා කල විට සෑදෙන ඵලයේ ව්‍යුහය අඳින්න.

(iii) B සංයෝගය $H^+$ / $KMnO_4$ සමඟ ප්‍රතික්‍රියා කළ විට, සාදන ඵලයේ ව්‍යුහය අඳින්න.

**තෙවන වාර පරීක්ෂණය**
**රසායන විද්‍යාව - 2019 - 13 ශ්‍රේණිය**
**B - කොටස**
**● මෙම කොටසින් කැමති ප්‍රශ්න දෙකකට පිළිතුරු සපයන්න.**

(05) (a) සංවෘත දෘඪ භාජනයක අන්තර්ගත AO වායුව හා හුමාලය අතර ඇති පහත සමතුලිතතාවය සළකන්න. $449^0$ C දී AO හා හුමාලය සම මවුල ප්‍රමාණ වලින් ගනිමින් මෙම ප්‍රතික්‍රියාව ආරම්භ කරන ලදී.

$$AO(g) + H_2O(g) \rightleftharpoons AO_2(g) + H_2(g)$$

$449^0$ C දී එක්තරා පීඩනයක් යටතේ දී ඉහත සමතුලිත මිශ්‍රණයේ AO(g) සාන්ද්‍රණය $134 \text{ mol m}^{-3}$ වන අතර $AO_2(g)$ වල ආංශික පීඩනය $16.08 \times 10^5 \text{Nm}^{-2}$ විය.

(i) $449^0$C දී $K_p$ හා $K_c$ ගණනය කරන්න. ($449^0$ C දී $RT = 6000 \text{ J mol}^{-1}$) ලෙස සළකන්න. සැ.යු. ඉහත සියලු වායු පරිපූර්ණ ලෙස හැසිරෙන බව උපකල්පනය කරන්න.

(ii) $449^0$C දී ඉහත සමතුලිත පද්ධතියේ සමස්ථ පීඩනය 5 ගුණයකින් වැඩි කළ හොත් සමතුලිත මිශ්‍රණය තුල $H_2(g)$ හි ආංශික පිඩනය කොපමණ වේද?

(b) පහත දැක්වෙන ප්‍රතික්‍රියා සළකන්න. තාපගතික දත්ත සපයා ඇත්තේ සම්මත අවස්ථාව සඳහා ය.

| | $\Delta H^0$ ($\text{kJ mol}^{-1}$) | $\Delta S^0$ ($\text{J K}^{-1} \text{mol}^{-1}$) |
|---|---|---|
| $\frac{1}{2}N_2(g) + \frac{1}{2}O_2(g) \rightarrow NO(g)$ | 90.25 | 12.5 |
| $NO(g) + \frac{1}{2}O_2(g) \rightarrow NO_2(g)$ | -57 | -73.5 |

(i) $NO_2(g) \rightarrow \frac{1}{2}N_2(g) + O_2(g)$ යන ප්‍රතික්‍රියාව සඳහා $\Delta H^0$ හා $\Delta S^0$ ගණනය කරන්න.

(ii) ඉහත (i) හි සඳහන් ප්‍රතික්‍රියාව සම්මත තත්ත්ව යටතේ දී ස්වයංසිද්ධ වේ දැයි සුදුසු ගණනය කිරීමක් භාවිතයෙන් පුරෝකතනය කරන්න.

(c) (i) හෙස් නියමය ලියා දක්වන්න.

(ii) පහත දී ඇති දත්ත භාවිතයෙන් MO(S) අයනික සංයෝගයේ, සම්මත දැලිස් එන්තැල්පිය බෝන් - හේබර් චක්‍රයක් ආධාරයෙන් ගණනය කරන්න.

| | |
|---|---|
| M(s) හි සම්මත ඌර්ධවපාතන එන්තැල්පිය | $= +148 \text{ kJ mol}^{-1}$ |
| MO(s) හි සම්මත උත්පාදන එන්තැල්පිය | $= -603 \text{ kJ mol}^{-1}$ |
| M(g) හි සම්මත පළමු අයනීකරණ එන්තැල්පිය | $= +736 \text{ kJ mol}^{-1}$ |
| M(g) හි සම්මත දෙවන අයනීකරණ එන්තැල්පිය | $= +1450 \text{ kJ mol}^{-1}$ |
| $O_2(g)$ හි සම්මත බන්ධන විඝටන එන්තැල්පිය | $= +496 \text{ kJ mol}^{-1}$ |
| O(g) හි සම්මත පළමු ඉලෙක්ට්‍රෝනකරණ එන්තැල්පිය | $= -139 \text{ kJ mol}^{-1}$ |
| ඔක්සිජන් වල සම්මත දෙවන ඉලෙක්ට්‍රෝනකරණ එන්තැල්පිය | $= +794 \text{ kJ mol}^{-1}$ |

(06) (a) (i) $0.1 \text{ mol dm}^{-3}$, HCl ද්‍රාවණයත්, $0.1 \text{ mol dm}^{-3}$, MOH(aq) ද්‍රාවණයත් සමඟ අනුමාපනය කිරීමේ දී එළැඹෙන සමකතා ලක්ෂ්‍යයේ pH අගය ගණනය කරන්න. MOH යනු දුබල භස්මයකි. එම උෂ්ණත්වයේ දී $K_w = 1 \times 10^{-14} \text{ mol}^2 \text{ dm}^{-6}$ , $K_b = 1.8 \times 10^{-5} \text{ mol dm}^{-3}$

(ii) පහත දැක්වෙන්නේ විද්‍යාගාරය තුල භාවිතයට ඇති දර්ශක 4 ක් පිළිබඳ තොරතුරුය.

| දර්ශකය | pH පරාසය |
|---|---|
| A | 1.2 - 2.8 |
| B | 8 - 9.6 |
| C | 4.4 - 6.2 |
| D | 3.1 - 4.4 |

ඉහත අනුමාපනය සඳහා මෙම දර්ශක අතරින් වඩා සුදුසු කුමක්දැයි නම් කරන්න.

(b) නියත උෂ්ණත්වයේ දී ජලය හා n –බියුටනෝල් (n – butanol) කලාප අතර ඇසිටික් අම්ලයෙහි විභාග සංගුණකය සෙවීමට යොදන පරීක්ෂණය නැවත සිහි කරන්න.

n –බියුටනෝල් $40\ cm^3$ ක් හා $1\ mol\ dm^{-3}$ සාන්ද්‍රණය වූ ජලීය ඇසිටික් අම්ලය $40\ cm^3$ ප්‍රතිකාරක බෝතලයකට එක් කර බෝතලය හොඳින් සොලවා පද්ධතිය සමතුලිතතාවයට එළැඹීමට ඉඩ හැර ස්ථර වෙන් වූ පසු ජලීය ස්ථරයෙන් හා n –බියුටනෝල් ස්ථරයෙන් $10\ cm^3$ බැගින් ගෙන සාන්ද්‍රණය $0.5\ mol\ dm^{-3}$ වූ ප්‍රමාණික NaOH ද්‍රාවණයක් සමඟ අනුමාපනය කරන ලදී. එම උෂ්ණත්වයේ දී ජලය n –බියුටනෝල් අතර විභාග සංගුණකය 0.6 වේ.

(i) එම උෂ්ණත්වයේ දි ජලය සහ n –බියුටනෝල් අතර විභාග සංගුණකය සඳහා ප්‍රකාශනයක් ලියන්න.
(ii) අනුමාපනයේ දී එක් එක් ස්ථරයේ වූ ඇසිටික් අම්ලය සමඟ ප්‍රතික්‍රියා කිරීමට අවශ්‍ය වූ NaOH පරිමාව ගණනය කරන්න.
(iii) ඉහත ගණනය කිරීම්වලදී ඔබ කරන උපකල්පන 2 ක් ප්‍රකාශ කරන්න.

(c) $Ag_2CrO_4$ යනු ජලයේ අල්ප වශයෙන් දියවෙන ලවණයකි. TK දී $Ag_2CrO_4$ හි $K_{sp} = 3.2\ x\ 10^{-11} mol^3\ dm^{-9}$ වේ.
(i) $Ag_2CrO_4$ හි ද්‍රාව්‍යතා ගුණිතය සඳහා ප්‍රකාශනයක් ව්‍යුත්පන්න කරන්න.
(ii) TK දී $Ag_2CrO_4$ හි ජල ද්‍රාව්‍යතාවය ගණනය කරන්න.
(iii) සාන්ද්‍රණය $1\ mol\ dm^{-3}$ වන AgCl ද්‍රාවණයක් තුල $Ag_2CrO_4$ හි ද්‍රාව්‍යතාවය ගණනය කරන්න.
(iv) (ii) හා (iii) අවස්ථා දෙකේදී $Ag_2CrO_4$ හි ද්‍රාව්‍යතාවය එකිනෙකට වෙනස් නම් එසේ වීමට හේතුව ගුණාත්මකව පැහැදිලි කරන්න.

(07) (a) පහත දැක්වෙන කෝෂය සම්මත තත්ත්ව යටතේ ඇති හයිඩ්‍රජන් අර්ධ කෝෂයකින් හා මැග්නීසියම් අර්ධ කෝෂයකින් සමන්විත වේ.




(i) සාන්ද්‍රණය හැර මෙහිදී භාවිතා වන අනිකුත් සම්මත තත්ත්ව 2ක් සඳහන් කරන්න.
(ii) ඇටවුමේ X ලෙස ලේබල් කර ඇති උපාංගයේ නම කුමක්ද?
(iii) ඉහත X ලෙස නම් කර ඇති උපාංගය තුළ පිරවීම සඳහා වඩා සුදුසු වන්නේ NaCl ද? KCl ද? ඔබේ තෝරා ගැනීමට හේතු පහදන්න.
(iv) කැතෝඩය හා ඇනෝඩය හඳුනාගන්න. ඔබේ පිළිතුර කෙටියෙන් පහදන්න.
(v) මෙම කෝෂය සඳහා කෝෂ සටහන ලියා දක්වන්න.
(vi) මැග්නීසියම් අර්ධ කෝෂයේ සම්මත ඔක්සිහරණ විභවය ගණනය කරන්න.
(vii) මෙම කෝෂයේ සිදුවන කෝෂ ප්‍රතික්‍රියාව ලියා දක්වන්න.

(b) සංගත අංකය 6ක් වන d ගොනුවට අයත් මූලද්‍රව්‍යය අයනයක් වන $Co^{3+}$, $NH_3$ හා $Cl^-$ සමඟ A, B හා C නම් සංයෝග 3ක් සාදයි. ඒවායින් 1 mol ක් වෙන වෙනම $AgNO_3$ සමඟ ප්‍රතික්‍රියා කළ විට A, B හා C පිළිවෙලින් අවක්ෂේප 1 mol, 2 mol හා 3 mol බැගින් ලබා දුනි.

(i) සංගත සංකීර්ණය මෙසේ අවක්ෂේප ලබා දෙන්නේ කෙසේද?

(ii) A, B සහ C වල ව්‍යුහ අපෝහනය කරන්න.

(iii) මෙම සංකීර්ණ වල හැඩය කුමක්ද?

(iv) C හි ව්‍යුහය ඇඳ දක්වන්න.

(c) වාණිජ විනාකිරි (සාන්ද්‍ර ඇසිටික් අම්ල ද්‍රාවණය) 10 mL ක් ගෙන 100 mL ක පරිමාමිතික ප්ලාස්කුවකට එක් කර ජලය දමා තනුක කර ඇසිටික් අම්ල ද්‍රාවණයක් පිළියෙල කර ඇත. එම තනුක ඇසිටික් අම්ල ද්‍රාවණයෙන් 15 mL ක් උදාසීන කිරීමට $0.1 mol\ dm^{-3}$ NaOH ද්‍රාවණ 13 mL ක් අවශය විය.

(i) ඉහත ප්‍රතික්‍රියාව සඳහා තුලිත රසායනික සමීකරණය ලියා දක්වන්න.

(ii) සාන්ද්‍ර ඇසිටික් අම්ල ද්‍රාවණයේ මවුලිකතාවය ගණනය කරන්න.

(iii) වාණිජ විනාකිරිවල ඇති ඇසිටික් අම්ල ප්‍රතිශතය ගණනය කරන්න.
(විනාකිරිවල ඝනත්වය $1.01\ g\ cm^{-3}$, C = 12, H = 1, O = 16)

## C - කොටස

• **ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න. (එක් එක් ප්‍රශ්නයට ලකුණු 15 බැගින් ලැබේ.)**

(08) (a) (i)  වලින් ආරම්භ කර පියවර ගණන 5ට නොවැඩි ක්‍රමයකින්  සංයෝගය සාදා ගන්නේ කෙසේද?

(ii) පහත දී ඇති ප්‍රතිකාරක පමණක් භාවිතා කර $CH_3CH_2CH_2Br$ වලින් ආරම්භ කර  යන සංයෝගය සංශ්ලේෂණය කරන්නේ කෙසේද?
ප්‍රතිකාරකඃ මධ්‍යසාරීය KOH, $Br_2/CCl_4$, HBr, Na(s), $Hg^{2+}$ / තනුක $H_2SO_4$

(b) $CH_3CH_2CHO$ සහ $CH_3COCH_3$ මිශ්‍රණයක් තනුක NaOH හමුවේ ප්‍රතික්‍රියා කළ විට සෑදෙන සියලුම ඵල වල ව්‍යුහ ලියා IUPAC නාමයන් ලියන්න.

